**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2018**

------------------------------------------------------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------------

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවල දී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම් ඉදිරිපත් කිරීමේ හා පවත්වා ගැනීමේ අඩුපාඩු

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංකපීඑෆ්/පීජී 21 හා 2002 මැයි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය පරිදි මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දිරිදීමනා අරමුදලේ ගිණුම් විගණනය වෙත ඉදිරිපත් කිරීමට මුදල් වර්ෂය අවසන් වී දින 88 ක් ගත වී තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කර නියමිත පරිදි ගිණුම් ඉදිරිපත් කිරීම. |

| | | |
|---|---|---|
| (ආ) බැංකු ගිණුම් දෙකක එකතුවක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් ශේෂය පෙන්නුම් කර තිබුණද, එහි විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | නිවැරදිව හා විධිමත්ව තොරතුරු වාර්තා කළ යුතු වීම. |
| (ඇ) ස්ථාවර තැන්පතු ශේෂය ලෙස රු.මිලියන 15.5 ක් අවසන් ගිණුම්වල සටහන් මගින් පෙන්වා තිබුණද, එම තැන්පත් හඳුනාගත හැකි පරිදි ආයෝජනය කළ ආයතනය හා අනුක්‍රමික අංක ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | නිවැරදිව හා විධිමත්ව තොරතුරු වාර්තා කළ යුතු වීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිණුම්කරණ භාවිතාව අනුව සාමාන්‍යයෙන් ඉතිරිකිරීමේ ගිණුම් වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොකරන නමුත් අරමුදල වෙනුවෙන් පවත්වා තිබුණු ඉතිරිකිරීම් ගිණුම වෙනුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර තිබුණි. එමෙන්ම, ඉතිරි කිරීමේ ගිණුමකට නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් ගැලපීම අතාත්වික වුවද, රු.292,330 ක ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකමක් හා හඳුනා නොගත් රු.605 ක ගෙවීමක් එම ගිණුමට අදාළ මුදල් ශේෂයට ගලපා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව කටයුතු කිරීම. |
| (ආ) 2018 වර්ෂයේ 4 වැනි කාර්තුව වෙනුවෙන් ගෙවිය යුතු දිරිදීමනාව, 2019 මාර්තු 07 දින පාලක මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2019 මාර්තු 29 දින සිදුකර තිබුණු බැවින් පාලක මණ්ඩලය අනුමත කළ මුදල ගෙවිය යුතු දිරිදීමනා ලෙස ගිණුම්වලට නොගැලපීම නිසා වර්ෂයේ අතිරික්තය රු.432,891 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | වර්ෂයට අදාළ ආදායම හා වියදම හැකිතරම් තාත්වික මට්ටමින් ගණනය කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙවැනි හා තෙවැනි කාර්තුවලට අදාළ බෙදිය නොහැකි දිරිදීමනා වූ රු.365,967ක් සමුච්චිත අරමුදලට බැරකර තිබුණ ද, එහි හර සටහනට අදාළ ලෙජර් ගිණුම් සටහනක් හෝ මුදල් පොත් සටහනක් පිළිබඳ තොරතුරු පැහැදිලි නොකෙරුණි. එසේම උපචිත වියදම් ගිණුමට 2018 මාර්තු 31 දින හරකර තිබුණු රු.281,698 ක වටිනාකමට අදාළ බැර සටහන පිළිබඳ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොවීය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සෑම ලෙජර් ගිණුමකටම අදාළව ද්විත්ව සටහන් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයට ගිණුම් පොත් පවත්වා ගතයුතු වීම. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| අරමුදල වෙනුවෙන් පවත්වා තිබුණු ඉතිරිකිරීම් ගිණුමේ පාස්පොතට අනුව ශේෂය හා අවසාන ගිණුම අනුව එම ගිණුමට අදාළ ශේෂය අතර වූ රු.191,725 ක වෙනස සසඳා නොතිබීම. | 47,812,524 | 48,004,249 | 191,725 | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගයන් හා ප්‍රභව ලියවිලිවල සඳහන් අගයන් එකිනෙකට සැසඳෙන ලෙස ගිණුම් පවත්වා ගැනීම. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දී රේඛීය අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය නියෝජනය කළ පාලක මණ්ඩල සාමාජිකයන්ගේ පත්වීම් ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොවීය. | පාලක මණ්ඩල සාමාජිකයන්ගේ පත්වීම් ලිපි | පිළිතුරු ලබා දී නොතිබුණි. | පාලක මණ්ඩල සාමාජිකයින්ගේ පත්වීම් ලිපි විධිමත් පරිදි විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 395 (ඈ) රෙගුලාසිය | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල අංක සහ නිකුත් කළ දිනයන් පිළිබඳ විස්තර බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සටහන් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගයන් සනාථ කෙරෙන සාක්ෂි ක්‍රමවත්ව, විධිමත්ව හා පරිපූර්ණව පවත්වා ගත යුතුවීම. |
| (ආ) | අංක PF/423 දරන 2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) | 03.2 (ආ) ඡේදය | දිරිදීමනා අරමුදල සතු ඉතුරුම් තැන්පතු ගිණුමේ මාසිකව රු.මිලියන 46.04 ක සාමාන්‍ය ශේෂයක් පැවැති බව සමාලෝචිත වර්ෂයේ මාස 12 ක නියැදියක් ලෙස ගෙන සිදු කළ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ හැකියාව පිළිබඳව සොයාබලා ඇති බවක් නිරීක්ෂණය නොවිය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි අතිරික්ත මුදලක් වේ නම් එය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා කටයුතු කළ යුතු වීම. |
| (ii) | 4.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසාන වී මාස 02 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තාව දින 35 ක ප්‍රමාදයකින් පසුව එනම් 2019 අප්‍රේල් 05 දින ඉදිරිපත් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට පියවර ගැනීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 3.26 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 2.68 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 0.58 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වාර්ෂික මෙහෙයුම් වියදම් රු.මිලියන 11.20 ක් වැඩි වී තිබුණද, වාර්ෂික ආදායම රු. මිලියන 11.98 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 අංක 04 දරන මෝටර් වාහන (ත්‍යාග දිරිදීමනා අරමුදල) නියෝග මාලාවේ 03 (1) නියෝගය පරිදි ත්‍යාග හා දිරිදීමනා සඳහා සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් 04ක් දක්වා තිබුණි. එහෙත් ඉන් ත්‍යාග සඳහා වූ ක්‍රියාකාරකම් 03ක් වෙනුවෙන් ගෙවීම් සිදුකර ඇති බව නිරීක්ෂණය නොවූ අතර දිරිදීමනා ලෙස ලද මුදලින් සියයට 08ක පරිපාලන වියදම් ගෙවීම හැරුණු කොට ඉතිරි සියයට 92 ක ප්‍රමාණයම කාර්ය මණ්ඩලය අතර දිරිදීමනා ලෙස බෙදාහැර තිබුණි.<br><br>මෙම අරමුදල ආරම්භයේ සිටම යෝජිත පරිදි ත්‍යාග වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවා නොතිබුණි. ත්‍යාග සඳහා සුදුසුකම් ලබන ක්‍රියාකාරකම් සඳහා ත්‍යාග ගෙවීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන්නේ නම්, සාවද්‍ය ලෙස වාහනවලට සිදුකරන වෙනස්කම් අවම කර ගැනීමේ හැකියාවක් පැවැති බව නිරීක්ෂණය විය.<br>ත්‍යාග හා විශේෂ ඇගයීම් වෙනුවෙන් මෝටර් රථ (අධිභාර) රෙගුලාසි කෙටුම්පත් කර 2017 මැයි 02 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් එවා තිබුණද, ඒ සම්බන්ධයෙන් වන නිරීක්ෂණ නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවීමට 2019 අප්‍රේල් 25 දින දක්වාම පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අරමුදලේ මූලික පරමාර්ථ පිළිබඳ වැඩි අවධානයක් යොමුකර කටයුතු කළ යුතු බව. |
| (ආ) දිරිදීමනා යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ක්‍රමවේදයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් කෙටුම්පත් කර දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණ ද, ඒ වෙනුවෙන් ද දෙපාර්තමේන්තු නිරීක්ෂණ ඉදිරිපත් කර එහි අවසාන වාර්තාව ලබාගැනීමට මේ දක්වාම පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | දෙපාර්තමේන්තු නිරීක්ෂණ කඩිනමින් ඉදිරිපත් කර අවසාන වාර්තාව ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරිදීමනා ගෙවීම සඳහා අරමුදල් ගොඩනැගෙන මූලාශ්‍ර, මෝටර් වාහන පනතේ 213 ඇ (2) වගන්තියේ දක්වා තිබුණද, එම කරුණු නොසලකා ඉතිරි කිරීමේ ගිණුමේ එකතු වී තිබුණු පොලී රු. මිලියන 1.5 ක් ද දිරි දීමනා ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. එමෙන්ම, ඉකුත් වර්ෂ 02ක තුළ දී දිරි දීමනා ගෙවීම සඳහා වැය කළ පොලී ආදායම රු.මිලියන 2.85 කි. ඒ අනුව, වර්ෂ 03ක දී පමණක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු රු. මිලියන 4.36 ක් දිරි දීමනා ගෙවීම සඳහා උපයෝජනය කර තිබුණි | පිළිතුරු ලබා දී නොතිබුණි. | පවතින නීති, රීතිවලට අනුකූලව කටයුතු කිරීම. |

**3.3** අයවැය පාලනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිරිදීමනා ගෙවීම් සඳහා ඇස්තමේන්තු කළ අගය, ඒ සඳහා වූ තථ්‍ය ගෙවීම හා සැසඳීමේ දී රු.මිලියන 3.01ක ඌන ඇස්තමේන්තු කිරීමක් නිරීක්ෂණය වූ අතර පරිපාලන වියදම් වෙනුවෙන් සිදුකර තිබුණු අධි වෙන් කිරීම ඇස්තමේන්තුගත වටිනාකමට සාපේක්ෂව සියයට 61 ක ප්‍රමාණාත්මක අගයක් ගෙන තිබුණි. එමෙන්ම, 2018 වර්ෂය තුළ තථ්‍ය වශයෙන් ලද ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් පොලී රු.මිලියන 2.34 ක් වෙනුවෙන් අයවැයගත වටිනාකමක් තීරණය කර නොතිබුණි. මේ අනුව අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |
| (ආ) | ක්‍රීඩා, පුහුණු, ප්‍රශංසා හා ත්‍යාග ආදී දෑ සඳහා වාර්ෂික අයවැය ලේඛනය මගින් රු. මිලියන 4.20 ක වෙන් කිරීම් සිදු කර තිබුණ ද, එවැනි වියදම් කිසිවක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | තාත්වික ලෙස අයවැය සංඛ්‍යා තීරණය කිරීම. |